# තිරසර සංවර්ධන,වන ජීවි හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ

## පහත සඳහන් තනතුරු වලට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ඇති සෆාරි උද්‍යානයට පහත තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන්, අයදුම්පත් කැඳවනු ලැබේ.

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් නිශ්වය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ලම හෝ නොපිරවීමට ජාතික සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් හට බලය ඇත.

| තනතුර | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය (රා.ප.ච.ලේ. අංක 3/2016 අනුව) | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩුව පවතින ස්ථානය |
|---|---|---|---|---|
| **ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය PL 1** | | | | |
| කම්කරු / උද්‍යාන කම්කරු | PL 1-2016 | 24,250-10x250-10x270-10x300-12x330-36,410 | 30 | හම්බන්තොට |

- **වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛණ II අනුව සිදු කරනු ලබයි.**

## <u>තනතුරුවලට බඳවා ගැනීම.</u>

### 01.අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා.පෙ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් (06) සමත් විම.

### 02.වෘත්තීය සුදුසුකම් :

අදාළ නොවේ.

**සටහන :-** කෙසේ වෙතත් තනතුරට අදාලව ලබා ඇති වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සැළකේ.

### 03. පළපුරුද්ද:

අවම පලපුරුද්දක් අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් ව්‍යුහගත පරීක්ෂණයේදී කෂේත්‍රය සම්බන්ධයෙන් ලබා ඇති පලපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ.

### 04. කායික සුදුසුකම්:

ශ්‍රී ලංකාවේ ඕනැම ස්ථානයක සේවය කිරිමටත් තනතුරේ රාජකාරි ඉටු කිරිමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

### 05. වයස:

අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45 නොවැඩි විය යුතුය.

## 06. බඳවා ගැනීමේ සුදුසුකම්:

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.
- තනතුරට බඳවා ගැනීමේ සුදුසුකම් 2018.07.20 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

## 07. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

7.1. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු වේ. තව ද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

7.2. තෝරාගත් අයදුම්කරුවන් පත්වීම් ලද දින සිට වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

## 08. බඳවා ගැනීමේ ක්‍රමය:

8.1.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අදාළ නොවේ |
| පළපුරුද්ද | 50 | |
| වෘත්තීය සුදුසුකම් | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

**සටහන: -**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුවම සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම් පත්රයක් **2018.07.20 දිනට හෝ එදිනට ප්‍රථම"අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්වෝද්යාන දෙපාර්තමේන්තුව, 251/2ඒ/2බී,කොළඹ පාර, වත්තේගෙදර හංදිය, මහරගම"** යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. අයදුම් පත්‍රය බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ජාතික සත්වෝද්යාන දෙපාර්තමේන්තුවේ කම්කරු/ උද්‍යාන කම්කරු තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් සටහන් කල යුතුය.

අසම්පූර්ණ, අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යලි සලකා බලනු නොලැබේ.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව.**